<u>උතුරු මැද පළාත් සභාව</u>

<u>2018 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්</u>

<u>ලියාපදිංචි කිරිම.</u>

2018 වර්ෂය සඳහා උතුරු මැද පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන වලට අවශ්‍ය ඉදිකිරිම්, ද්‍රව්‍ය සහ සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමති රාජ්‍ය / සංස්ථා / රජයට පවරා ගත් වෙළඳ ආයතන / සැපයුම්කරුවන් / නිෂ්පාදකයින් / බෙදාහරින්නන් සහ ඉදිකිරිම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැදවනු ලැබේ.

<u>කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරිම</u>

**<u>සුදුසුකම්</u>**

01. උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට සහ පළාත තුල ස්වකීය ව්‍යාපාර හෝ ශාඛා ආයතන පවත්වාගෙන යන කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි විය හැකි අතර, රුපියල් ලක්ෂ 10 ඉක්මවන **"ඉදිකිරිම් සඳහා සෑම කොන්ත්‍රාත්කරුවෙක්ම ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය" (CIDA)** ආයතනයේ ලියාපදිංචි වී සිටිය යුතුය. (අයදුම්පත්‍රය සමඟ ලියාපදිංචියේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

02. 2016,2017 වර්ෂ වල සිවිල් ඉංජිනේරු කටයුතු පිළිබඳව සිය හැකියාවන් ඉදිරිපත් කර සනාථ කළ යුතුය.(අයදුම්පත්‍රය සමඟ පිටපත් ඉදිරිපත් කළ යුතුය)

03. සුදුසුකම් සහ වත්කම් සනාථ කෙරෙන සහතික ඉදිරිපත් කළ යුතුය.(අයදුම් පත්‍රය සමඟ පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

<u>සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම.</u>

<u>සුදුසුකම් :-</u>

01. උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි සැපයුම්කරුවන්ට සහ පළාත තුල ස්වකීය ව්‍යාපාර හෝ ශාඛා ආයතන පවත්වාගෙන යන සැපයුම්කරුවන්ට සැපයීම් සඳහා ලියාපදිංචි විය හැකි අතර ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර තිබිය යුතුය.(අයදුම් පත්‍රය සමඟ ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

02. (අ) සම්පූර්ණයෙන්ම දැවයෙන් නිම කරන ලද භාණ්ඩ සැපයීම සඳහා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අවසර පත්‍රය ලබා තිබිය යුතුය.(අයදුම් පත්‍රය සමඟ එහි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

(ආ) සැපයුම් ද්‍රව්‍ය විකිණීම සහ සේවා සැපයිම සඳහා පවත්වා ගෙන යන ආයතන ඒ සඳහා පළාත් පාලන ආයතනයෙන් ලබා ගන්නා ලද බලපත්‍රය සහ එය පවත්වා ගෙන යාම සඳහා පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි වීමට අදාලව නෛතිකව ලබා ගත යුතු බලපත්‍ර ලබා ගෙන තිබිය යුතුය.සෑම ව්‍යාපාරික ආයතනයක්ම තම ව්‍යාපාරය පවත්වා ගෙන යාම වෙනුවෙන් පළාත් පාලන ආයතනයකට බදු මුදල් (වෙළඳ බලපත්‍ර ගාස්තු) ගෙවා තිබිය යුතුය. (2017 වර්ෂයේ බදු මුදල් ගෙවූ රිසිට් පත්‍රයේ පිටපතක් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය)

(ඇ) පළාත් පාලන ආයතන වෙත වෙළඳ බලපත්‍ර ගාස්තු නොගෙවනු ලබන, සමාගම් පනත යටතේ සංස්ථාගත කළ සමාගම් 2017 වර්ෂයට අදාලව පිරිවැටුම් බදු/ආදායම් බදු ගෙවන ලද බවට තහවුරු වන ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

(ඈ) ආරක්ෂක සේවා සැපයීම සඳහා රාජ්‍ය ආරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමේ සහතිකය ලබා තිබිය යුතුය.(අයදුම් පත්‍රය සමඟ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

(ඊ) ආපනශාලා පවත්වාගෙන යාම සඳහා මහ නගර සභා බල ප්‍රදේශයක නම්,ආහාර පනතට අනුකූලව කටයුතු කරන බවට මහජන සෞඛ්‍ය පරික්ෂකගේ සහතිකයද, ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයක නම් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිගේ සහතිකයද තිබිය යුතුය.(අයදුම් පත්‍රය සමග පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

03. 2016 ,2017 වර්ෂවල සැපයුම් හා සේවා සිදුකර ඇත්නම්, එම සේවා සම්පූර්ණ කර ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

04. සැපයුම් හා සේවා ඇණවුම් සැපයීමට අවශ්‍ය මුල්‍යමය සහ අනෙකුත් හැකියාවන් ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

05. ආනයනය කරන සැපයුම්කරුවෙකු නම් ප්‍රධාන නියෝජිතයෙකු ද / නියෝජිතයාද / උප නියෝජිතයෙකුද යන්න ලිඛිතව සනාථ කළ යුතුය.

06. වැට් බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇත්නම් ඊට අදාළ ලියකියවිලි වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

<u>අයදුම් කිරීම හා ලියාපදිංචි කිරීම:-</u>

01. අයදුම් පත් **2017.08.08** දින සිට **2017.09.29** දින පෙ.ව **9.00 -** ප.ව **3.00** දක්වා මෙම කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ.

**02. සැපයුම් කරුවන් සඳහා ඉල්ලුම්පත් සමඟ විස්තර පත්‍රිකාව ලබා ගැනිම සඳහා සෑම අයදුම්පතක් සඳහාම රු. 400.00 ක ආපසු නොගෙවන මුදලක් මුදලින් ගෙවිය යුතුය. තැපැලෙන් අයදුම් පත්‍ර ලබා ගැනිම සඳහා මුදල් ඇණවුමක් එවිය යුතුය. මුදල් ඇණවුමකින් ගෙවීම් කරන්නේ නම් ලබන්නා "ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත" සහ ගෙවන කාර්යාලය "අනුරාධපුරය" යන්න සඳහන් කළ යුතුය.**

03. එක් එක් අයිතමය සඳහා ලියාපදිංචි විමට වෙන වෙනම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

04. කොන්ත්‍රාත් කරුවන් සඳහා ඉල්ලුම්පත් සමඟ විස්තර පත්‍රිකාව ලබා ගැනිම සඳහා සෑම අයදුම්පතක් සඳහාම රු. 100.00 ක ආපසු නොගෙවන මුදලක් මුදලින් ගෙවිය යුතුය ලියාපදිංචි ගාස්තු පහත පරිදි මුදලින් ගෙවිය යුතු අතර, එම මුදල් ආපසු ගෙවනු නොලැබේ. ගාස්තු ප්‍රමාණයන් පහත පරිදිවේ.

(අ) <u>කොන්ත්‍රාත් සහ ඉදිකිරිම් සඳහා ලියාපදිංචි ගාස්තු ප්‍රමාණයන්</u>

| | | | |
|---|---|---|---|
| 1. | රු.ලක්ෂ 10 ට අඩු | - | 1,000.00 |
| 2. | රු.ලක්ෂ 10 සිට රු. ලක්ෂ 20 දක්වා | - | 2,000.00 |
| 3. | රු.ලක්ෂ 20 සිට රු.ලක්ෂ 50 දක්වා | - | 3,000.00 |

04. **අයදුම්පත්‍ර 2017.10.14 වෙනි දින ප.ව 3.00 ට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවීම හෝ අතින් ගෙනවිත් සහකාර ලේකම් (මුදල්) වෙත භාරදීම හෝ කළ හැකිය. අතින් ගෙනවිත් භාරදෙනු ලබන අයදුම්පත් සඳහා රිසිට්පතක් එම අවස්ථාවේදී ලබා ගත යුතුය.**

05. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවර **"2018 සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

<u>වෙනත් කොන්දේසි :-</u>

01. මිළ ගණන් කැඳවීම ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කරනු ලබන අතර , උතුරු මැද පළාත් සභාවේ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්ද මිළ ගණන් කැඳවීමේ අයිතිය උතුරු මැද පළාත් සභාව සතුවේ.

02. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත්‍රය සලකා බලා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙත ඇති හැකියාවන් සහ සුදුසුකම් මත පමනක් එකී අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය හා හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උතුරු මැද පළාත් සභාව සතුවේ.

03. ලියාපදිංචි කර ගන්නා සියළුම සැපයුම්කරුවන්ට / කොන්ත්‍රාත්කරුවන්ට ලියාපදිංචි කළ බව ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

04. යම් සැපයුම්කරුවකුගේ / කොන්ත්‍රාත්කරුවකුගේ සේවය සැපයීම පිළිගත නොහැකි මට්ටමට දුර්වල තත්වයක පවතින්නේ නම්ද, සැපයුම් / කොන්ත්‍රාත් කටයුතු කිරීමේදී යම් වංචා සහගත ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවයක යෙදුනා යැයි, උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් වරයා සෑහීමකට පත්වන තොරතුරු මත ආයතන අසාදු ලේඛණයට ඇතුලත් කොට මින් ඉදිරියට සැපයුම්කරුවකු / කොන්ත්‍රාත්කරුවෙකු ලෙස පිළි නොගැනීමට කටයුතු කළ හැක. ඒ පිළිබද වූ පූර්ණ අයිතිය උතුරු මැද පළාතේ ප්‍රධාන ලේකම් සතු වන්නේය.

❖ සෑම අයදුම් පත්‍රයවක් සමග පහත ලියකියවිලි අමුනා තිබිය යුතුය.එසේ නොමැති සියලුම අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත.
- 2017 වර්ෂයට පළාත් පාලන ආයතන වෙත වාර්ෂික වෙළද බලපත්‍ර ගාස්තු ගෙවූ ලදුපතේ පිටපතක්.
- සමාගම් පනත යටතේ සංස්ථාගත කල සමාගම් 2017 වර්ෂයට අදාලව පිරිවැටුම් බදු /ආදායම් බදු ගෙවූ ලදුපතේ පිටපතක්.

| අයිතම අංකය | අයිතම විස්තරය |
|---|---|
| | **01 කාර්යාලයීය උපකරණ සැපයීම :-** |
| 01-01 | කාර්යාලයීය ලී බඩු හා උපකරණ සැපයීම.- (දැව). |
| 01-02 | කාර්යාලයීය උපකරණ සැපයීම.- (යකඩ, ප්ලාස්ටික් හා දැව මිශ්‍ර). |
| 01-03 | ඡායා පිටපත් යන්ත්‍ර, යතුරු ලියන යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර හා වේලාව සටහන් කිරිමේ යන්ත්‍ර සැපයීම. |
| 01-04 | කැමරා ප්‍රොජෙක්ටර්,ආරක්ෂිත කැමරා,වීඩියෝ උපකරණ සැපයීම - (රූපවාහිනී, විසීඩී/ඩීවීඩී යන්ත්‍ර, ඩෙක් යන්ත්‍ර, ටෙප්රෙකෝඩර්, රේඩියෝ හා ඩෙක්පිස්, හිස් කැසට් පීස්) ආදිය සැපයීම. |
| 01-05 | වායු සමන යන්ත්‍ර සැපයීම. |
| 01-06 | පරිගණක යන්ත්‍ර සැපයීම. |
| 01-07 | පාපැදි සැපයීම. |
| 01-08 | ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම |
| 01-09 | මිනින්දෝරු උපකරණ |
| 01-10 | කිරුම් මිනුම් උපකරණ සැපයීම |
| 01-11 | ගිණි නිවන උපකරණ හා ද්‍රව්‍ය සැපයීම |
| **02 කාර්යාලයීය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම:-** | |
| 02-01 | ලිපි ද්‍රව්‍ය සැපයීම. |
| 02-02 | පරිගණක පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම. (ඩිස්කට්, සීඩි/ඩීවීඩී තැටි, රිබන්) ආදිය සැපයීම. |
| 02-03 | රබර් මුද්‍රා, දින මුද්‍රා හා නාම පුවරු සැකසීම හා සැපයීම. |
| 02-04 | පානීය ජලය සැපයීම. |
| 02-05 | පානීය ජල සැපයුම් (ජල පෙරන) උපකරණ සැපයීම. |
| 02-06 | කාර්යාලීය සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම. |
| 02-07 | පදක්කම්, සමරු තිලින , සමරු පලක හා කුසලාන සැපයීම. |
| **03 කාර්යාලීය සේවා සැපයීම :-** | |
| 03-01 | කාර්යාලීය මුද්‍රණ කටයුතු, පින්තූර රාමු කිරිම, හා දැන්වීම් පුවරු ඇදිම සහ සැකසීම. |
| 03-02 | පරිගණක හා ඡායාපිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කිරිම හා නඩත්තු සේවා. |
| 03-03 | පරිගණක ජාල ගත කිරිම,පරිගණක මෘදුකාංග සංවර්ධනය, ස්ථාපිත කිරිම හා උපදේශාත්මක සේවා. |
| 03-04 | ආරක්ෂක සේවා සැපයීම. |
| 03-05 | කාර්යාලීය උපකරණ අළුත්වැඩියා හා නඩත්තු සේවා සැපයීම. |
| 03-06 | ඇමදුම් සේවා හා සනීපාරක්ෂක සේවා සැලයීම. |
| 03-07 | වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරිම. |
| 03-08 | අභ්‍යන්තර දුරකථන සේවා . |
| 03-09 | පුහුණු නුපුහුණු ශ්‍රම සැපයුම්.(පෙදරේරු,වඩු කාර්මික,විදුලි කාර්මික) |
| 03-10 | වීඩියෝ කිරිම, ඡායාරූප මුද්‍රණය. |
| 03-11 | වෛද්‍යය උපකරණ අළුත් වැඩියා කිරීම |
| 03-12 | දේශීය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව. |
| 03-13 | විදුලි උපකරණ හා විදුලි ජනක යන්ත්‍ර අළුත්වැඩියාව. |
| 03-14 | නිළ ඇඳුම් සහ රෙදි මැසීමේ (තිර රෙදි, වෙනත්) සේවා සැපයීම. |
| 03-15 | නර්තන අංග වලට අදාල නර්තන වස්ත්‍රාභරණ සැපයීම |
| 03-16 | නර්තන සහ සංගීත භාණ්ඩ අළුත් වැඩියා කිරීම |
| 03-17 | ළදරුවන්ට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම. |

| | |
|---|---|
| 03-18 | ආපන ශාලා පවත්වාගෙන යාම. |
| 03-19 | පැස්සුම්,යකඩ හා ඇලුමිනියම් ආශ්‍රිත සේවාවන් |
| 03-20 | රූපලාවන්‍ය හා අත්කම් පාඨමාලා සඳහා උපකරණ සැපයීම |
| **04 පාසැල් උපකරණ සැපයීම:-** | |
| 04-01 | පාසැල් ලී බඩු උපකරණ සැපයීම (ඩෙස්ක්, පුටු, මේස) දැව. |
| 04-02 | පාසැල් උපකරණ සැපයීම (ඩෙස්ක්, පුටු, මේස) යකඩ, ප්ලාස්ටික් හා දැව මිශ්‍ර. |
| 04-03 | චිත්‍ර විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-04 | විද්‍යා රසායනාගාර විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-05 | සංගීත / නැටුම් / තූර්යවාදන විෂය සම්බන්ධ උපකරණ සැපයීම. |
| 04-06 | පාසල් සිනු හා රට හුණු සැපයීම. |
| 04-07 | විශේෂ අධ්‍යපනික විෂය උපකරණ සැපයිම (අඳ, ගොලු, හා බිහිරි ළමුන් සඳහා). |
| 04-08 | නොවිධිමත් අධ්‍යාපන උපකරණ සැපයීම. |
| 04-09 | ගුණාත්මක යෙදවුම් උපකරණ සැපයීම. |
| 04-10 | පාසල් වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය කිරිම. |
| 04-11 | පාවහන්,බෑග්, හා හම් ආශ්‍රිත නිෂ්පාදන |
| **05 පුස්තකාල පොත් හා ග්‍රන්ථ සැපයීම** | |
| 05-01 | පුස්තකාල පොත් හා ග්‍රන්ථ සැපයිම. |
| **06 ක්‍රීඩා භාණ්ඩ සැපයීම** | |
| 06-01 | ක්‍රිඩා භාණ්ඩ සැපයීම. |
| 06-02 | ක්‍රීඩා භාණ්ඩ අළුත්වැඩියාකිරිම. |
| 06-03 | ක්‍රීඩා නිළ ඇඳුම් සැපයීම |
| 06-04 | පිහිනුම් තටාක නඩත්තු,රසායනික ද්‍රව්‍යය සැපයීම හා ඊට අදාළ උපකරණ සැපයිම |
| **07 ඇගළුම් කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම :-** | |
| 07-01 | පේෂ කර්ම අත් යන්ත්‍ර ,පේෂ කර්ම උපකරණ සහ මහන මැෂින් , අමතර කොටස් සැපයීම. |
| 07-02 | රෙදිපිළි, නූල් වර්ග හා ඩයි වර්ග සැපයීම. |
| 07-03 | නිමි ඇඳුම් සැපයීම |
| **08 ධීවර පශු සම්පත් හා කෘෂිකාර්මික :-** | |
| 08-01 | කෘෂි යන්ත්‍ර සැපයීම (ධාන්‍ය පිටි සැකසීමේ යන්ත්‍ර / තලා පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර / ගොයම්කපන යන්ත්‍ර / පොප්කෝන් නිෂ්පාදන යන්ත්‍ර). |
| 08-02 | කෘෂිකාර්මික උපකරණ සැපයීම හා කමත්අසුරනු / පැරශුට් තවාන් තැටි / ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති / සෙවන දැල් / කුන්තානි (දහයියා අඟුරු කරනු ලබන බැරල්) වී තම්බන බැරල් / මෙට්‍රික් මී මැසි පෙට්ටි සැපයීම. |
| 08-03 | කෘෂිකාර්මික උපකරණ සැපයීම (වතුර පොම්ප, වෙනත් කෘෂි ආම්පන්න). |
| 08-04 | ලෝහ භාණ්ඩ සැපයීම (කැති, පොරෝ, උදලු, නගුල් ආදිය). |
| 08-05 | කෘෂිකාර්මික රෝපණ ද්‍රව්‍ය සැපයීම - පැල වර්ග. |

| | |
|---|---|
| 08-06 | කෘෂිකාර්මික රෝපණ ද්‍රව්‍ය සැපයීම - බීජ වර්ග (එළවළු, බීජ / අනයනික ලොකු. ළූනු / බීජ / ආනයනික බඩ ඉරිඟු, බීජ / පැපොල්, බීජ / වෙනත් වර්ග). |
| 08-07 | බීජ ලබා ගැනීම සඳහා අවශ්‍ය පළතුරු හා එළවළු සැපයීම(දෙළුම්,කිලෝ පේර,ගස් ලබු,දෙහි,තිබ්බටු ,මිටි ඇඹරැල්ලා,මිටි මුරුංගා ආදි) |
| 08-08 | බද්ධ කිරීමට අවශ්‍ය අංකුර හා රිකිලි වර්ග සැපයීම.(අඹ,දොඩම් ආදි) |
| 08-09 | අංකුර හා රිකිලි බද්ධ කිරීම. |
| 08-10 | බීජ හා පැළ රෝපණය කිරීම සඳහා අවශ්‍ය පොලිතීන් මළු වර්ග සැපයීම. |
| 08-11 | පොහොර වර්ග. |
| 08-12 | කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයීම (වල් නාශක / කෘමි නාශක). |
| 08-13 | කෘෂිකාර්මික හා ආර්ථික කටයුතු සඳහා යොදා ගන්නා සියළුම සතුන් සැපයීම. |
| 08-14 | සත්ව ආහාර, බෙහෙත් හා උපකරණ සැපයීම. |
| 08-15 | ධීවර කර්මාන්තය සඳහා මත්ස්‍ය හා මත්ස්‍ය ඇඟිල්ලන් සැපයීම. |
| 08-16 | ධීවර කර්මාන්තය සඳහා උපකරණ සැපයීම. |
| **09 හස්ත කර්මාන්තය සඳහා උපකරණ සැපයීම:-** | |
| 09-01 | වඩු වැඩ හා මේසන් වැඩ සඳහා උපකරණ සැපයීම. |
| 09-02 | ලුහු ඉංජිනේරු උපකරණ සැපයීම. |
| 09-03 | හස්ත කර්මාන්ත උපකරණ සැපයීම. |
| 09-04 | ඉරු දැව සැපයීම. |
| **10 සෞඛ්‍ය ආරක්ෂක උපකරණ හා ඖෂධ වර්ග හා සේවා සැපයීම.** | |
| 10-01 | බටහිර ඖෂධ වර්ග සැපයීම. |
| 10-02 | ආයුර්වේද ඖෂධ වර්ග සැපයීම. |
| 10-03 | ශල්‍ය උපකරණ සැපයීම. |
| 10-04 | ශල්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම. |
| 10-05 | හෘද රෝග ඒකක වෛද්‍ය උපකරන සැපයීම. |
| 10-06 | විකිරණ යන්ත්‍ර හා එක්ස්රේ පටල ඇතුළු අනෙකුත් විකිරණ උපාංග සැපයීම. |
| 10-07 | රසායනාගාර උපකරණ සැපයීම. |
| 10-08 | රසායනාගාර පරික්ෂණ සඳහා වන පාරිභෝගික ද්‍රව්‍ය හා රසායනික ද්‍රාවණ සැපයීම. |
| 10-09 | උගුර, කන, නාසය වෛද්‍ය උපකරණ සැපයීම. |
| 10-10 | අක්ෂි වෛද්‍ය උපකරණ සැපයීම. |
| 10-11 | විකලාංග වෛද්‍ය උපකරණ හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම. |
| 10-12 | දන්ත ශල්‍ය වෛද්‍ය මෙවලම් හා ද්‍රාවණ සැපයීම. |
| 10-13 | වෙනත් වෛද්‍ය උපකරණ , පාරිභෝගික උපාංග ( බැන්ඩේජ් රෝල,ගොස් රොල්,ප්ලාස්ටර් රෝල්,මිනුම් සරා,ඩෙටොල්,කපු පුළුන්,සර්ජිකල් ස්ප්‍රිට්,ඩිස්පොසිබල් ග්ලව්ස්,බෙහෙත් ඇසුරුම් කවර) හා ද්‍රාවණ සැපයීම. |
| 10-14 | දේශිය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැපයීම. |
| 10-15 | රෝහල් ඇඳන්, ස්ක්‍රීන්, රෝද පුටු, සූතිකාගාර ඇඳන්, රෝහල් වලට බෙහෙත් අල්මාරි, ට්‍රොලි, රෝහල් ස්ථාම(ලොකර්), සේලයින් ස්ටෑන්ඩ් ආදිය සැපයීම. |

| | |
|---|---|
| 10-16 | ඔක්සිජන් හා ගෑස් සැපයීම. |
| 10-17 | මදුරු දැල් සැපයීම. |
| 10-18 | මෙට්ට සැපයීම. |
| 10-19 | දර සැපයීම. |
| 10-20 | මුළුතැන්ගෙයි උපකරණ සැපයීම. |
| 10-21 | රෙදි සේදීම හා පිරිසිදු කිරිම. |
| 10-22 | කරණවැමි සේවා සැපයීම. |
| 10-23 | කැලි කසල එකතු කිරිම හා ප්‍රවාහණය ඇතුළු සනිපාරක්ෂක කටයුතු. |
| **11 ආහාරද්‍රව්‍ය සැපයීම:-** | |
| 11-01 | කෙටි ආහාර, බීම වර්ග හා කේටරින් සේවා සැපයීම. |
| 11-02 | රෝහල් සඳහා අමු ආහාර හා පිසූ ආහාර සැපයීම. |
| 11-03 | වියලි ආහාර ද්‍රව්‍ය සැපයීම. |
| 11-04 | එළවළු හා මස් මාළු සැපයීම. |
| **12 වාහන අළුත්වැඩියාව හා අමතර කොටස් සැපයීම :** | |
| 12-01 | සියලුම වර්ගයේ මෝටර් රථ අමතර කොටස් සැපයීම. |
| 12-02 | ටයර්, ටියුබ්, හා බැටරි සැපයීම. |
| 12-03 | වාහන අළුත්වැඩියා කිරිම. |
| 12-04 | වායු සමන යන්ත්‍ර අළුත් වැඩියාව හා සේවා කිරිම.(කාර්යාල හා නිවාස ඇතුලුව) |
| 12-05 | වාහන කුෂන් වැඩ (ටෙන්ට් රෙදි මැසිම, ෂිට් කවර දැම්ම). |
| 12-06 | වාහන සේවා කිරීම. |
| **13 ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම :-** | |
| 13-01 | ගොඩනැගිලි උපකරණ, ඉදිකිරිම් ද්‍රව්‍ය හා ගොඩනැගිලි සවිකිරිම්, කටුකම්බි ආදී උපකරණ සැපයීම. |
| 13-02 | විදුලි උපකරණ, උදුන්, විදුලි පංකා, ශීතකරණ හා විදුලි ජනක යන්ත්‍ර සැපයීම. |
| 13-03 | තීන්ත වර්ග, වාර්නිෂ් හා තීන්ත ආලේප කිරීමට ගනු ලබන ද්‍රව්‍ය සැපයීම. |
| 13-04 | වීදුරු සැපයීම. |
| 13-05 | ජල හා විදුලි සම්බන්ධතා උපකරණසැපයීම(වතුර පොම්ප,වයර් ආදිය). |
| 13-06 | විදුලි කාර්මික සේවා සැපයීම. |
| **14 මාර්ග සංවර්ධනය හා අළුත් වැඩියා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම :-** | |
| 14-01 | කළුගල් සැපයීම. |
| 14-02 | වැලි සැපයීම. |
| 14-03 | හියුම් පයිප්ප සැපයීම. |
| **15 ඉදිකිරිම් හා කොන්ත්‍රාත් සේවා :-** | |
| 15-01 | ගොඩනැගිලි ඉදිකිරිම හා අළුත්වැඩියාව. |
| 15-02 | මාර්ග ඉදිකිරිම හා අළුත්වැඩියාව. |

| | |
|---|---|
| 15-03 | වැව් අමුණු,ඇළ මාර්ග,ක්‍රීඩා පිට්ටනි,ඉදිකිරිම හා ප්‍රතිසංස්කරණය. |
| 15-04 | උද්‍යාන අලංකරණය. |
| 15-05 | ගෘහ අලංකරණය. |
| 15-06 | උපදේශාත්මක සේවා සැපයීම - ඉදිකිරීම් සඳහා උපදේශාත්මක සේවාවන් සැපයීම,සැලසුම් කිරීම,ඇස්තමේන්තු,තක්සේරු කිරිම මිනින්දෝරු කටයුතු හා අධික්ෂණය. |
| 15-07 | උපදේශාත්මක සේවා සැපයීම -විදුලි ඉංජිනේරු පරිපථ සැලසුම් හා උපදේශාත්මක සේවා සැපයීම (ගොඩනැගිලි). |
| 15-08 | උපදේශාත්මක සේවා සැපයීම -යාන්ත්‍රික ඉංජිනේරු හා මල ප්‍රවාහන / ජලනල පරිපථ සැලසුම් හා උපදේශාත්මකසේවා සැපයීම (ගොඩනැගිලි). |
| **16 උත්සව භාණ්ඩ සැපයීම** | |
| 16-01 | කූඩාරම්, වේදිකා, තොරන් හා වර්ණ ධජ කුලියට සැපයීම. |
| 16-02 | පුටු, මේස, පිඟන්, කෝප්ප, හැදි, ගෑරුප්පු හා කෑම පිසින උපකරණ කුලියට සැපයීම. |
| 16-03 | ශබ්ද වාහිනි කුලියට සැපයීම. |
| 16-04 | අලංකරණ කටයුතු සඳහා විදුලි බුබුළු හා ආලෝකකරණ උපකරණ සැපයීම. |
| 16-05 | සැරසිලි සඳහා ස්භාවික මල් හා කෘතිම මල් සැපයීම. |
| **17 ප්‍රවාහන සේවා** | |
| 17-01 | ප්‍රභූ ප්‍රවාහන සේවා කුලියට සැපයීම |
| 17-02 | මගී ප්‍රවාහන සේවා කුලියට සැපයීම. |
| 17-03 | භාණ්ඩ ප්‍රවාහන සේවා කුලියට සැපයීම. |
| 17-04 | බර වාහන කුලියට සැපයීම. |
| **18 වෙනත්** | |
| 18-01 | හිස් මිනීපෙට්ටි සැපයීම. |
| 18-02 | හිමිකම් නොපාන මළසිරුරු වල දැමීම. |

සටහන්

01. ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කරමින් භාණ්ඩ සැපයීමක් සඳහා හෝ සේවාවන් සඳහා ලියාපදිංචි වන ආයතන හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් දැඩි නීතිමය පියවර ගැනිමට කටයුතු කරනු ලැබේ.

02. සියළුම අයදුම්කරුවන් යෝග්‍යතාවය පිළිබඳව විමසුමකට ලක් කිරිමෙන් අනතුරුව ලියාපදිංචිය සිදුකරනු ලබන බව කාරුණිකව සලකන්න.

03. මෙම පුවත්පත් දැන්වීම ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිළ වෙබ් අඩවිය වන "www.cs.nc.gov.lk" හි භාගත තුල (Downloads) ඇතුළත් කර ඇති අතර , ලියාපදංචි කිරිමේ කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනිමක් වෙතොත් 025-2235471 දුරකථන අංකය ඇමතීමෙන් විස්තර ලබාගත හැකිය.

ලිපිනය:-
ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුරය.

එච්.එම්.පී.බංඩාර,
ප්‍රධාන ලේකම්,

උතුරු මැද පළාත.